සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Sabaragamuwa Provincial Department of Education**
சபரகமுவ மாகாணக்கல்வி திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2024
## අවසාන වාර පරීක්ෂණය

භූගෝල විද්‍යාව I
வரலாறு
Geography I

**22 | S | I**

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

පැය තුනයි
03மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதி வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

උපදෙස්:

✵ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. **I කොටස** බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වන අතර ඒවාට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.

✵ **I කොටසේ** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.

✵ II කොටසෙ හි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.


✵ **III කොටස** ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

✵ I, II සහ III කොටස්වල පිළිතුරු පත එකට අමුණා භාර දිය යුතු ය.

## I කොටස

01. 1 : 100,000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමක ප්‍රධාන මාර්ගයක සැබෑ දිග 4km කි. එය සිතියමේ දක්වා ඇත්තේ cm කොපමණ ප්‍රමාණයකින්ද?
1. 40cm 2. 16cm 3. 8cm 4. 4cm 5. 2cm (.........)

02. පහත සමොච්ඡ රේඛා සටහනෙහි A හා B සම්බන්ධව නිවැරදි ප්‍රකාශය කුමක් ද?




(1) A නෙරුවක් වන අතර B නිම්නය වේ
(2) B නෙරුවක් වන අතර A නිම්නය වේ
(3) A හා B නිම්න ලක්ෂණ වේ
(4) A උත්තල බෑවුම වන අතර B අවතල බෑවුම වේ
(5) A අවතල බෑවුම වන අතර B උත්තල බෑවුම වේ
(.........)

03. ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියම් නිර්මාණයේ දී ඒකාබද්ධ කර ඇති අංක 64 හා 65 සිතියම් යුගලය වන්නේ,
1. අම්පාර - පොතුවිල් 2. තම්පාඩෙයි - පොතුවිල්
3. කෝමාරි - කල්මුනේ 4. කල්මුනේ - අම්පාර
5. තිරුක්කෝවිල් - තම්පාඩෙයි (.........)

04.  ලෙස 1 : 50000 භූ ලක්ෂණ සිතියමක දක්වා ඇති දුම්රිය මාර්ගය හා සම්බන්ධ මෙම සංකේතය කුමක්ද?

1. බිම්ගෙය
2. පාලම
3. කැපුම
4. දුම්රිය පොළ
5. කණ්ඩිය (.........)

05. පහත රූපයෙහි දැක්වෙන උපාංගය හා ඉන් සිදුකෙරෙන කාර්යය නිවැරදිව දැක්වෙන ප්‍රකාශය වන්නේ කුමක්ද ?



(1)දත්ත සකස් කෙරෙන මධ්‍ය සැකසුම් ඒකකයයි

(2)දත්ත ඉදිරිපත් කරන සන්දර්ශකයයි

(3)දත්ත ඇතුළත් කරන අංකන ඵලකයයි

(4)දත්ත සකස් කෙරෙන අංකන ඵලකයයි

(5)දත්ත ඇතුළත් කරන සන්දර්ශකයයි (.........)

06. GPS දත්ත ලබා ගැනීමේ දී අත්ලාන්තික් සාගරයේ පිහිටුවා ඇති මෙහෙයුම් මධ්‍යස්ථාන දෙක පිළිවෙළින් ඇතුළත් වරණය වන්නේ,

1. කොළරාඩෝ - දියාගෝ ගාෂියා
2. ක්වායිලෙයින් - ඇසෙන්ෂන්
3. ඇසෙන්ෂන් - හවායි දූපත්
4. දියාගෝ ගාෂියා - කොළරාඩෝ ස්ප්‍රින්ග්
5. හවායි දූපත් - ක්වායිලෙයින් (.........)

07 ද්විත්ව තීරු ප්‍රස්තාරයක් මගින් නිරූපණය කළ හැකි විචල්‍යයන් නිවැරදි ව දැක්වෙන පිළිතුර මින් කුමක් ද?

(1) රටක ජනසංඛ්‍යාවේ වයස් ව්‍යුහය

(2) ආනයන - අපනයන ප්‍රමාණය

(3) බෝග කිහිපයක අස්වැන්න

(4) වර්ෂාපතන හා උෂ්ණත්ව ප්‍රමාණය

(5) කුඩා දරුවකුගේ බර හා උස සටහන (.........)

08. ප්‍රස්තාරයක් නිර්මාණය කිරීමේදී අවධානය යොමු කළ යුතු මූලිකාංගයක් වන්නේ,

1. නිවැරදි බව
2. පැහැදිලි බව
3. අංග සම්පූර්ණ බව
4. ආකර්ෂණීය බව
5. වර්ණ භාවිතය (.........)

09. දත්ත ව්‍යාප්තියක කේන්ද්‍රික අගයේ සිට විසිරී ඇති දත්ත අනුපිළිවෙළට සකස් කළ විට ඉහළ චාතුර්ථකයට ඉහළින් පිහිටන දත්ත වල ප්‍රතිශතය කොපමණද?

1. 25%
2. 50%
3. 37.5%
4. 75%
5. 100% (.........)

10. සාමූහිකව මධ්‍යන්‍යය ගණනය කිරීමේදී භාවිත කරන $\bar{x} = x_0 + \left(\frac{\sum fd}{n}\right) c$ සූත්‍රයේ $x_0$ න් අදහස් කරන්නේ කුමක් ද?

1. සංඛ්‍යාතය
2. පන්ති ප්‍රාන්තරයේ තරම
3. අපගමන වල එකතුව
4. උපකල්පිත මධ්‍යන්‍ය ඇති පන්තියේ මධ්‍ය අගය
5. දත්ත වල එකතුව (.........)

11. ශිලා ගෝලීය පද්ධතියේ උප පද්ධතියක් නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,
   1. පාංශු ගෝලීය පද්ධති  2. මහවැලි ගංගා පද්ධතිය
   3. නිවර්තන වනාන්තර පරිසර පද්ධතිය  4. මෝසම් සුළං පද්ධතිය
   5. සෞරග්‍රහ මණ්ඩල පද්ධතිය (.........)

12. ජෛව ගෝලීය සංවිධාන මට්ටම් නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,
   1. පරිසර පද්ධතිය, ප්‍රජාව ඒකෛක ජීවියා, ගහනය, ජෛව ගෝලය
   2. ප්‍රජාව, ඒකෛක ජීවියා, ගහනය, පරිසර පද්ධතිය, ජෛව ගෝලය
   3. ජෛව ගෝලය, ඒකෛක ජීවියා, ප්‍රජාව, පරිසර පද්ධතිය, ගහනය
   4. ගහනය, ප්‍රජාව, ඒකෛක ජීවියා, පරිසර පද්ධතිය, ජෛව ගෝලය
   5. ඒකෛක ජීවියා, ගහනය, ප්‍රජාව, පරිසර පද්ධතිය, ජෛව ගෝලය (.........)

13. පහත සඳහන් ලක්ෂණ අඩංගු භූ අභ්‍යන්තර කලාපය කුමක්ද?
   - පෘථිවි ස්කන්ධයෙන් 2/3 ක් පමණ අයත්ය.
   - මොහොරොවිචික් අසන්තතියෙන් ආරම්භ වේ.
   - ප්‍රධාන කොටස් දෙකකින් සමන්විතය.


   1. හරය  2. කබොල  3. ප්‍රාවරණය
   4. බාහිර හරය  5. පහළ ප්‍රාවරණය (.........)

14. භාෂ්මික ආග්නේය පාෂාණයට උදාහරණයක් වන්නේ
   1. ඩයොරයිට්  2. ගැබ්රෝ  3. ග්‍රැනයිට්
   4. ජිප්සම්  5. ඩොලමයිට් (.........)




15.
   පහත දක්වා ඇති සිතියමෙහි A සහ T අක්ෂර වලින් දක්වා ඇති පාෂාණ වර්ගය කුමක්ද?
   1. වන්නි සංකීර්ණය  2. විජයන් සංකීර්ණය
   3. ජුරාසික පාෂාණ  4. කඩුගන්නාව නයිස්
   5. මයෝසීන හුණුගල් (.........)

16. A, B හා C රූප සටහන් මඟින් දක්වා ඇති විභේද නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.




   1. A – සුවිභේදය, B – සාමාන්‍ය විභේදය, C – උළැගි විභේදය
   2. A – සාමාන්‍ය විභේදය, B – උඩුකුරු විභේදය, C – හෝවිට්
   3. A – හෝවිට්, B – සාමාන්‍ය විභේදය, C – සුවි භේදය
   4. A – උඩුකුරු විභේදය, B – සාමාන්‍ය විභේදය, C – හෝස්ට්
   5. A – සුවි භේදය, B – උළැගි විභේදය, C – හෝවිට් (.........)

17. වඩදිය මට්ටම සහ බාදිය මට්ටම අතර පිහිටි වෙරළ කොටස හඳුන්වන්නේ,
   1. මැත වෙරළ  2. පැල වෙරළ
   3. මොබ වෙරළ  4. ඔබ වෙරළ
   5. පෙර වෙරළ (.........)

18. පහතරට වියළි කලාපයෙහි දේශගුණ ලක්ෂණ නිවැරදිව දක්වා ඇති වරණය කුමක්ද?
   1. සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 27°C පමණ වන අතර වසර පුරාම පැවතුණ වර්ෂාපතනයක් දැකිය හැකිය.
   2. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 1250mm – 2000mm වන අතර ඊසාන දිග මෝසමෙන් වර්ෂාව ලැබේ.
   3. වසරේ වැඩි කාලයක් වියළි කාලගුණයක් පවතින අතර උස් බිම්වල 3000mm වැඩි වර්ෂා පතනයක් ලැබේ.
   4. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 1250mm ට අඩු වන අතර දිගු නියං කාලයක් පවතී.
   5. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 2000mmට වැඩි වන අතර වර්ෂාපතන අතිරික්තයක් තිබීම (.........)

19. ජලය පවත්නා විවිධ ස්වරූප නිවැරදිව දක්වා ඇති වරණය වන්නේ,
   1. උල්කා ජලය, සහජාත ජලය, මැග්මීය ජලය
   2. මතුපිට ජලය, භූගත ජලය, වායු ගෝලීය ජලය
   3. කේෂාකර්ෂණ, ජලාකර්ෂණ, ගුරුත්වාකර්ෂණ,
   4. ඝන, ද්‍රව, වායු
   5. මිරිදිය, කරදිය, කිවුල් දිය (.........)

20. පහත දක්වා ඇති A හා B ලක්ෂණ නිවැරදිව පිළිවෙළින් දක්වා ඇති බියෝම දෙක තෝරන්න.

A උණුසුම් වියළි දේශගුණයක් පවතී.

B පතනශීලී ශාක දැකිය හැකිය

   1. Aකාන්තාර බියෝම, B මධ්‍යධරණී බියෝම
   2. Aසෞම්‍ය කලාපීය වනාන්තර බියෝම , B මධ්‍යධරණී බියෝම
   3. A මධ්‍යධරණී බියෝම, Bසෞම්‍ය කලාපීය වනාන්තර බියෝම
   4. A මධ්‍යධරණී බියෝම, B නිවර්තන වර්ෂා වනාන්තර
   5. A නිවර්තන වර්ෂා වනාන්තර, B කාන්තාර බියෝම (.........)

21. මෑත කාලයේ මියන්මාර් සහ චීනයේ හයිනෑන් ආදී රාජ්‍යයන්ට බරපතල ව්‍යසනයක් සිදු කරමින් හමා ගිය යාගි සුළි කුණාටුව අයත් වන්නේ,
   1. ටයිෆුන් වර්ගයටය.
   2. හරිකේන් වර්ගයටය
   3. බැගියෝ වර්ගයටය
   4. විලිවිලිස් වර්ගයටය
   5. ටොනේඩෝ වර්ගයටය (.........)

22. ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ක්‍රියාවලිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   1. 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත ඉදිරිපත් කිරීම.
   2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධානියා ජනාධිපතිවරයාය.
   3. ආපදා කළමනාකරණ චක්‍රයේ අවස්ථා පහකි.
   4. ආපදා කළමනාකරණ ජාතික සභාව පිහිටුවනු ලැබුවේ 2005 වර්ෂයේ දීය.
   5. ආපදා පිළිබඳ පෙර දැනුම්දීම් සිදු කරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනි. (.........)

23. දකුණු ආසියාතික සහයෝගීතා පාරිසරික වැඩසටහනට අදාල ශ්‍රී ලංකාවට පැවරී තිබූ කාර්ය වන්නේ,
   1. නීති සකස් කිරීම, අධ්‍යාපනය හා පුහුණු කිරීම
   2. පාරිසරික බලපෑම තක්සේරුව, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණ
   3. පරිසර පද්ධති හා ප්‍රජා වන වගාව
   4. බල ශක්ති, වගකීම් හා පාරිසරික ගුණය
   5. සංචාරක කර්මාන්තය (.........)

24. බහු විෂයික ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට අදාළ නොවන අංශය වන්නේ,
   1. භූ තාක්ෂණය
   2. පරිසර අධ්‍යයනය
   3. ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ
   4. දේශගුණ විපර්යාස අධ්‍යයනය
   5. නාය යෑම් අධ්‍යයනය (.........)

25. පහත දැක්වෙන වනාන්තර පරිසර පද්ධති අතරින් අභය භූමියක් වන්නේ,
   1. රිටිගලයි
   2. විල්පත්තුවයි
   3. මින්නේරියයි
   4. යාලයි
   5. ආනවිලුන්දාවයි (.........)

26. ස්ථාවර ජන සංඛ්‍යා පිරමීඩයක් තුළින් හඳුනාගත හැකි ලක්ෂණක් අඩංගු වරණය වන්නේ,
   1. උපත් අනුපාතිකය අඩුය.
   2. ආයු අපේක්ෂාව අඩු ය.
   3. ළදරු මරණ අනුපාතිකය ඉහළ ය.
   4. මාතෘ මරණ අනුපාතිකය ඉහළ ය.
   5. ස්වභාවික වර්ධනය ඉහළ ය. (.........)

27. ලෝක ජන සංඛ්‍යාවට වර්ෂයකට එකතු වන උපත් ප්‍රමාණය ඇතුළත් පිළිතුර වන්නේ,
   1. මිලියන 137
   2. මිලියන 145
   3. මිලියන 152
   4. මිලියන 166
   5. මිලියන 188 (.........)

28. කෘෂිකාර්මික ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් ජනාවාස ගොඩනැගීමේ දී ඉන්දු නිම්නයේ බිහිවූ නගරය වන්නේ,
   1. ඇතැන්ස්
   2. ස්පාටා
   3. එරිදූ
   4. රෝමය
   5. හරප්පා (.........)

29. ඓතිහාසික යුගයේ දී මෙරට බිහිවූ ජනාවාසයක් ඇතුළත් පිළිතුර වන්නේ,
   1. බුන්දල
   2. පාහියන්ගල
   3. මාතොට
   4. අනුරාධපුර
   5. පතිරාජවෙල (.........)

30. ග්‍රීන් බනානා කාර්මික නාගරික කලාපය විහිදී ඇත්තේ,
   1. වයඹ දිග එංගලන්තය අවට
   2. මධ්‍යම යුරෝපය අවට
   3. පිට්ස්බර්ග් කලාපය
   4. මධ්‍යධරණී මුහුද අවට
   5. රියෝ කලාපය අවට (.........)

31. ශ්‍රී ලංකාවේ නාගරීකරණය අවම අගයක් ගැනීමට බලපෑ හේතුවක් වන්නේ,
   1. ස්වභාවික වර්ධන අඩුවීම.
   2. ස්වභාවික උපද්‍රව වල බලපෑම
   3. යටිතල පහසුකම් වල දියුණුව
   4. උද්ධමනය ඉහළ අගයක් ගැනීම
   5. දේශපාලන අස්ථාවර බව (.........)

32. අප්‍රිකානු කලාපයේ කෘෂිකාර්මික ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා හඳුන්වා දුන් මුහුන් කළ වී ප්‍රභේදය වන්නේ,
   1. නෙරිකාස්
   2. නොරින් 10
   3. IR 8
   4. රන් සහල් (ගෝල්ඩන් රයිස්)
   5. බාරිම් (.........)

33. ජෛවීය කෘෂිකර්මයේ දී පාංශු කළමනාකරණය සඳහා සිදුකරනු ලබන උපාය මාර්ගයක් වන්නේ,
1. වල් පැළෑටි කපා දැමීම.
2. රනිල ශාක වගා කිරීම.
3. හිරු එළිය වැටීම වැළැක්වීම.
4. රසායනික පොහොර යෙදීම.
5. කෙම් ක්‍රම භාවිතය (.........)

34. පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට කෘෂි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති ආර්ථික මධ්‍යස්ථාන වන්නේ,
1. තඹුත්තේගම හා වැලිසර
2. දඹුල්ල හා නාරාහේන්පිට
3. මීගොඩ හා කැප්පටිපොළ
4. දඹුල්ල හා කැප්පටිපොළ
5. මීගොඩ හා නාරාහේන්පිට (.........)

35. ඉහළම කාබන් ප්‍රතිශතයක් සහිත ගල් අඟුරු වර්ගය වන්නේ,
1. ලිග්නයිට්
2. බිටුමිනස්
3. ඇන්ත්‍රසයිට්
4. මැග්නටයිට්
5. පීට් (.........)

36. ශ්‍රී ලංකාවේ බෝල මැටි හා කෙඔලින් නිධි ව්‍යාප්තව ඇති ප්‍රධාන ප්‍රදේශ දෙක වන්නේ,
1. පොල්කොටුව සහ වස්කඩුව
2. පුල්මුඩේ සහ එප්පාවල
3. දෙදියවල හා බොරලැස්ගමුව
4. කයිකාවල හා සේරුවාවිල
5. මීටියාගොඩ හා කහටගහ (.........)

37. කර්මාන්ත ස්ථානගත වීමේදී මෑත කාලය තුළ වැඩි බලපෑමක් ඇති කර තිබෙන සාම්ප්‍රදායික නොවන සාධකය කුමක් ද?
1. වෙළෙඳ පොළ
2. ප්‍රාග්ධනය
3. බලශක්ති
4. ශ්‍රමය
5. තොරතුරු තාක්ෂණය (.........)

38. හික්කඩුව වෙරළ තීරය අයත්වන්නේ පහත දැක්වෙන කුමන සංචරණ ප්‍රභේදයට ද ?

(1)වික්‍රමයන් ආශ්‍රිත සංචරණය

(2)පාරිසරික සංචරණය

(3)ප්‍රතිමෝදක සංචරණය

(4)සංස්කෘතික සංචරණය

(5)සෞන්දර්යය සංචරණය

39. Merck (මර්ක්) බහු ජාතික සමාගම අයත් වන රට වන්නේ,
1. නෙදර්ලන්තය
2. ජපානය
3. ඇමරිකා එක්සත් ජනපදය
4. එක්සත් රාජධානිය
5. ජර්මනිය (.........)

40. අග්නිදිග ආසියානු සංගමයේ ආරම්භක සාමාජික රටක් වන්නේ,
1. පිලිපීනය
2. වියට්නාමය
3. මියන්මාර්
4. කාම්බෝජය
5. තායිවානය (.........)

## II කොටස

1. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලද 1 : 50,000 පරිමාණයේ හූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ඡ රේඛා අන්තරය මීටර 20 කි. එම සිතියම පාදක කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
   - i. 1 - 4 දක්වා නම්කර ඇති ලක්ෂණ නම් කරන්න (ල. 2)
   - ii. A චතුරස්‍රය තුළ දක්නට ලැබෙන පොදු සේවා සපයන ආයතන හතරක් සඳහන් කරන්න. (ල. 2)
   - iii. සිතියම්ගත ප්‍රදේශයේ ඉහළම ත්‍රිකෝණමිතික ස්ථානයේ උස දක්වන්න. (ල. 1)
   - iv. B අක්ෂයෙන් පෙන්වන ස්ථානයේ පිහිටීම නිවැරදිව දක්වන්න. (ල. 2)
   - v. B423 මාර්ගයේ දුර කිලෝමීටර වලින් ගණනය කර දක්වන්න. (ල. 1)
   - vi. P - Q රේඛාව ඔස්සේ හඳුනාගත හැකි භෞතික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 1)
   - vii. X - Y රේඛාව ඔස්සේ ඇති හරස්කඩ නිර්මාණය කරන්න. (ල. 5)
   - viii. සිතියම් ප්‍රදේශයේ ජනාවාස ව්‍යාප්තියේ ස්වභාවයට බලපා ඇති භෞතික සාධක දෙකක් හා මානව සාධක එකක් පැහැදිලි කරන්න. (ල. 6)

2. සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් මතු සඳහන් දෑ සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි ලකුණු කොට නම් කරන්න. (ල. 10)
   - i. ඇල්ප්ස් කඳු
   - ii. ගිබ්සන් කාන්තාරය
   - iii. පරානා ගඟ
   - iv. කර්කටක නිවර්තනය
   - v. මලාවි විල (නියාසා)
   - vi. පෙරුවියන් ප්‍රවාහය
   - vii. ප්‍රෙයරිස් තෘණ භූමිය
   - viii. ඉරානය
   - ix. 2024 ලෝක ජල සමුළුව පැවැත් වූ නගරය
   - x. ලොව අවම නාගරිකරණ මට්ටම සහිත රාජ්‍යය

## III කොටස

3. i. සිතියමක් පරිහරණය කිරීමේ දී එය භාවිතා කරන මට්ටම අනුව බෙදා ඇති අවස්ථා තුන නම් කරන්න. (ලකුණු 3)
   - ii. තේමා සිතියමක් නිර්මාණය කරන ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)
   - iii. පහත වගුවෙහි දත්ත පදනම් කරගෙන රේඛාංකික සිතියමක් නිර්මාණය කරන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 6)
     (දත්ත පරාස 5 ක් ලෙසත්, මුල්ම පරාසය 0 - 3999 ලෙස ගන්න.
     සපයා ඇති ශ්‍රී ලංකා දිස්ත්‍රික් සිතියම භාවිතා කරන්න.

වගුව 1 - ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව වී අස්වැන්න - (2022 - 2023)

| | දිස්ත්‍රික්කය | වී අස්වැන්න (මෙ.ටොන්) | | දිස්ත්‍රික්කය | වී අස්වැන්න (මෙ.ටොන්) |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 490 | 14 | කිලිනොච්චිය | 3812 |
| 2 | ගම්පහ | 1732 | 15 | මඩකලපුව | 9330 |
| 3 | කළුතර | 1582 | 16 | අම්පාර | 15265 |
| 4 | මහනුවර | 1802 | 17 | ත්‍රිකුණාමලය | 6787 |
| 5 | මාතලේ | 3664 | 18 | කුරුණෑගල | 14029 |
| 6 | නුවරඑළිය | 522 | 19 | පුත්තලම | 2768 |
| 7 | ගාල්ල | 1141 | 20 | අනුරාධපුරය | 17408 |
| 8 | මාතර | 1364 | 21 | පොළොන්නරුව | 13008 |
| 9 | හම්බන්තොට | 8537 | 22 | බදුල්ල | 3841 |
| 10 | යාපනය | 1384 | 23 | මොනරාගල | 6688 |
| 11 | මන්නාරම | 3539 | 24 | රත්නපුර | 2237 |
| 12 | වව්නියාව | 2976 | 25 | කෑගල්ල | 1146 |
| 13 | මුලතිව් | 3656 | | | |

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2023

4. i. ගුවන් ඡායාරූපයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල. 3)
   ii. දුරස්ත සංවේද ක්‍රියාවලිය කටු රූපසටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 6)
   iii. ශ්‍රී ලංකාවේ දුරස්ත සංවේද තාක්ෂණය භාවිතා කළ අවස්ථා තුනක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල. 6)

5. වගුව 2 හි දක්වා ඇති දත්ත ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගුව 2 - ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ජන සංඛ්‍යාව - 2012 (දහස් වලින්)

| | දිස්ත්‍රික්කය | ජන සංඛ්‍යාව | | දිස්ත්‍රික්කය | ජන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 2324 | 14 | කිලිනොච්චිය | 113 |
| 2 | ගම්පහ | 2305 | 15 | මඩකලපුව | 526 |
| 3 | කළුතර | 1222 | 16 | අම්පාර | 649 |
| 4 | මහනුවර | 1375 | 17 | ත්‍රිකුණාමලය | 379 |
| 5 | මාතලේ | 485 | 18 | කුරුණෑගල | 1618 |
| 6 | නුවරඑළිය | 712 | 19 | පුත්තලම | 762 |
| 7 | ගාල්ල | 1063 | 20 | අනුරාධපුරය | 860 |
| 8 | මාතර | 814 | 21 | පොළොන්නරුව | 406 |
| 9 | හම්බන්තොට | 599 | 22 | බදුල්ල | 815 |
| 10 | යාපනය | 584 | 23 | මොනරාගල | 451 |
| 11 | මන්නාරම | 99 | 24 | රත්නපුර | 1088 |
| 12 | වව්නියාව | 172 | 25 | කෑගල්ල | 840 |
| 13 | මුලතිව් | 92 | | | |

මුලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව - 2012

i. වගුව 2 දත්ත උපයෝගී කරගනිමින් සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තියක් පිළියෙල කරන්න.(ල. 4)
(පංති 5කින් යුතුවද, පළමු පංතියේ 92 - 539 ලෙස ද ගන්න. පංති පරතරය 447 කි.)

ii. එම සංඛ්‍යාත ව්‍යාප්තිය පදනම් කරගෙන මධ්‍යස්ථය ගණනය කරන්න. පහත සමීකරණය යොදා ගන්න.

$$Mcln = L + \left(\frac{\frac{n}{2} - fb}{fw}\right) C$$

iii. ඉහත සංඛ්‍යාත ව්‍යාප්තිය පදනම් කරගෙන ඩගිවිය වක්‍රයක් නිර්මාණය කරන්න. (ල. 5)

iv. දත්ත විශ්ලේෂණයේ දී ඉහත ඔබ iii හි නිර්මාණය කළ ප්‍රස්තාර ක්‍රමයේ යෝගයතාව පිළිබඳ කරුණු තුනක් දක්වන්න. (ල. 3)

6. i. වගුව 3 හි දක්වා ඇති දත්ත ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගුව 3 - 2005 - 2013 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අපනයන (රුපියල් බිලියන)

| වර්ගය | 2005 | 2007 | 2009 | 2011 | 2013 |
|---|---|---|---|---|---|
| තේ | 82 | 114 | 136 | 165 | 199 |
| රබර් | 5 | 12 | 11 | 23 | 9 |
| පොල් | 11 | 14 | 19 | 29 | 27 |
| වෙනත් කෘෂි බෝග | 18 | 43 | 44 | 62 | 99 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය දත්ත - 2014


i. වගුව 3 හි දක්වා ඇති දත්ත නිරූපණය කිරීම සඳහා බහු රේඛීය ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. (ල. 7)

ii. ඔබ නිර්මාණය කළ ප්‍රස්තාරය ඇසුරෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අපනයන සම්බන්ධව කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල. 3)

iii. වගුව 3 හි දත්ත නිරූපණය කළ හැකි වෙනත් සිතියම් විද්‍යාත්මක ක්‍රමයක් කටු සටහන් මඟින් පැහැදිලි කරන්න.

(ල. 5)

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2024
## අවසාන වාර පරීක්ෂණය
### සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2024

## අවසාන වාර පරීක්ෂණය

### සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



ප්‍රශ්න අංකය : 2

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2024

## අවසාන වාර පරීක්ෂණය

## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Sabaragamuwa Provincial Department of Education**

சபரகமுவ மாகாணக்கல்வி திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2024

## අවසාන වාර පරීක්ෂණය

භූගෝල විද්‍යාව II
வரலாறு
Geography II

| 22 | S | II |
|---|---|---|

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

පැය තුනයි
03மணித்தியாலம்
Three Hours


අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதி வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

උපදෙස්:

✵ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න

### I කොටස

1. i. පහත සිතියමේ A, B, C, D ලෙස ලකුණු කර ඇති ප්‍රධාන භූ තැටි නම් කරන්න. (ල. 2)




ii. භූ තැටි චලනය නිසා ඇතිවන ප්‍රතිඵල තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

iii. අක්‍රාන්ත යමකම ක්‍රියාවලිය නිසා නිර්මාණය වන භූ රූප තුනක් රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 6)

iv. නිෂ්ක්‍රාන්ත යමහල් ක්‍රියාවලිය හේතුවෙන් නිර්මාණය වන භූ රූප තුනක් රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 6)

2. i. නිම්න ග්ලැසියර හා මහාද්වීපික ග්ලැසියර වෙන් වෙන්ව හඳුන්වන්න. (ල. 2)
   ii. ග්ලැසියර ආශ්‍රිත  ඛාදන ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ල. 6)
   iii. නිම්න ග්ලැසියරකරණය ආශ්‍රිත ඛාදිත භූ රූප දෙකක් සහ මහද්වීපික ග්ලැසියරකරණය ආශ්‍රිත නිධිසාධිත භූ රූප එකක් රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 6)
   iv. ග්ලැසියරකරණය මානව කටයුතු කෙරෙහි බලපාන ආකාරය කරුණු තුනක්  ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 6)

3. i. දේශගුණ මූලිකාංග හතරක් නම් කරන්න. (ල. 2)
   ii. දේශගුණය පාලනය කෙරෙන සාධක දෙකක් පැහැදිලි කරන්න. (ල. 6)
   iii. කෙපන් ගේ ලෝක දේශගුණ වර්ගීකරණයේ නිවර්තන මෝසම් (AM) දේශගුණයේ,
   අ  - ව්‍යාප්ති ප්‍රදේශ දෙකක් දක්වන්න.
   ආ - එම දේශගුණයේ ගති ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ල. 6)
   iv. වාසුළි වර්ෂාව මගින් ශ්‍රී ලංකාවට ඇති කරන බලපෑම් කරුණු තුනක් ඇසුරෙන් පහදන්න. (ල. 6)

4. i. බියෝමයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල. 2)
   ii. කාන්තාර බියෝමය ආශ්‍රිතව ශාක හා සත්ත්ව ප්‍රජාවේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් සාකච්ඡා කරන්න. (ල. 6)
   iii. (a) ශ්‍රී ලංකාවේ තෘණබිම් පරිසර පද්ධති වර්ග තුනක ව්‍යාප්ති ප්‍රදේශ එක බැගින් සඳහන් කරන්න
   (b) තෘණබිම් පරිසර පද්ධතිවල කැපී පෙනෙන ලක්ෂණ දෙකක් කෙටියෙන්  පැහැදිලි කරන්න. (ල. 6)
   iv. ශ්‍රී ලංකාවේ තෘණබිම් පරිසර පද්ධතියට එල්ල වී ඇති අභියෝග තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

## II කොටස

5. පහත වගුව 1 හි දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සංක්‍රමණ 2004 - 2012 දක්වා ය.

වගුව 1 - ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සංක්‍රමණ - 2004 - 2012

| වර්ෂය | ආගමනය (දහස්) | විගමන (දහස්) | ශුද්ධ සංක්‍රමණ අනුපාතය |
|---|---|---|---|
| 2004 | 1963 | 1487 | -1.2 |
| 2005 | 1391 | 1421 | -1.5 |
| 2006 | 1440 | 1470 | -1.5 |
| 2007 | 1530 | 1565 | -1.8 |
| 2008 | 1044 | 1688 | -2.1 |
| 2009 | 1645 | 1673 | -1.7 |
| 2010 | 2106 | 2129 | -1.1 |
| 2011 | 2433 | 2479 | -2.2 |
| 2012 | 2496 | 2548 | -2.6 |

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

i. වගුව 1 හි දත්ත වලට අනුව ශ්‍රී ලංකාවේ ශුද්ධ සංක්‍රමණය සම්බන්ධව කැපී පෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 2)

ii. ඉහත වගුව අනුව ශ්‍රී ලංකාවේ ශුද්ධ සංක්‍රමණ අනුපාතිකය සෘණ අගයක් ගැනීම නිසා ඇති විය හැකි බලපෑම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

iii. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සංක්‍රමණවල දැකිය හැකි ප්‍රවණතා තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

iv. ජාත්‍යන්තර සංක්‍රමණ නිසා ගමනාන්ත රටවලට ඇතිවිය හැකි ධනාත්මක ප්‍රතිඵල දෙකක් සහ සෘණාත්මක ප්‍රතිඵල එකක් පැහැදිලි කරන්න. (ල. 6)

6. i. නාගරිකරණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන සාධක දෙකක් දක්වන්න (ල. 2)

ii. නාගරීකරණය ආශ්‍රිත සාධනීය ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

iii. ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිතව හඳුනාගත හැකි ගැටලු තුනක් පහදන්න. (ල. 6)

iv. එම ගැටලු විසඳීම සඳහා ගෙන ඇති පියවර තුනක් සාකච්ඡා කරන්න. (ල. 6)

7. i. නිෂ්පාදන කර්මාන්තයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල. 2)

ii. කර්මාන්ත ස්ථානගත වීමේදී ශ්‍රමය හා බලශක්තිය වැදගත් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ල. 6)

iii. කර්මාන්ත ස්ථානගත වීමේ මෑත කාලීන ප්‍රවණතා තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

iv. ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තය, ජාතික ආර්ථිකයට බලපාන ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පහදන්න. (ල. 6)

8. i. ගෝලීයකරණයේ ප්‍රධාන අංග හතර නම් කරන්න. (ල. 2)

ii. ජාතික ආර්ථිකයක් ගෝලීය ආර්ථිකයක් බවට පත්වීමේ දී වැදගත් වන අංග තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

iii. ගෝලීයකරණයේ ප්‍රධාන වාහකයක් ලෙස තොරතුරු සන්නිවේදන තාක්ෂණය බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ල. 6)

iv. අග්නිදිග ආසියාතික සංගමය (ACEAN) මුහුණ දෙන ගැටලු හා අභියෝගතුනක් ඇසුරෙන් පහදන්න. (ල. 6)

# 13 ශ්‍රේණිය - භූගෝල විද්‍යාව I

## පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අං. | පිළිතුර | ප්‍රශ්න අං. | පිළිතුර | ප්‍රශ්න අං. | පිළිතුර | ප්‍රශ්න අං. | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 01) | 2 | 11) | 1 | 21) | 1 | 31) | 3 |
| 02) | 4 | 12) | 5 | 22) | 4 | 32) | 1 |
| 03) | 5 | 13) | 3 | 23) | 3 | 33) | 2 |
| 04) | 2 | 14) | 2 | 24) | 4 | 34) | 4 |
| 05) | 1 | 15) | 3 | 25) | 5 | 35) | 3 |
| 06) | 3 | 16) | 4 | 26) | 1 | 36) | 3 |
| 07) | 2 | 17) | 1 | 27) | 2 | 37) | 5 |
| 08) | 5 | 18) | 2 | 28) | 5 | 38) | 3 |
| 09) | 1 | 19) | 4 | 29) | 4 | 39) | 4 |
| 10) | 4 | 20) | 3 | 30) | 2 | 40) | 2 |

## II කොටස - පිළිතුරු

01. (i) 1. ගල 2. හේන් වගාව 3. ඓතිහාසික ස්ථාන

4. පළාත් මායිම්

(ii) පාසල, තැපැල් කාර්යාලය, පශු වෛද්‍ය කාර්යාලය, කලාප අධ්‍යාපන කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රෝහල

(iii) 613 m

(iv) උතුරු අක්ෂාංශ $7^{\circ}45'$ නැගෙනහිර දේශාංශ $80^{\circ}35'$

(v) 8 - 9 km

(vi) රළු බිම, තැනිතලා,

(vii) හරස්කඩ නිවැරදිව දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(viii) භෞතික - තැනිතලා භූමිය

- මද බෑවුම් ප්‍රදේශ

සංස්කෘතික - ප්‍රවාහන පහසුකම්

- වාරිමාර්ග කටයුතු
- සේවා සපයන ආයතන

(මෙම ලක්ෂණ පැහැදිලි කිරීමට ලකුණු දෙන්න.)

03. (i)
- සිතියම් කියවීම
- සිතියම් විවරණය
- සිතියම් අර්ථකථනය

(ii)
- සේයා සිතියම්
- සම රේඛා සිතියම්
- තිත් සිතියම් මේවා කෙටියෙන් පැහැදිලි කළ යුතු වේ.

(iii)

| පරාස | දිස්ත්‍රිකක ගණන | දිස්ත්‍රික්ක |
|---|---|---|
| 0 - 3999 | 18 | පහත දිස්ත්‍රික්ක හැර 18 ක් |
| 4000 - 7999 | 02 | ත්‍රිකුණාමලය, මොණරාගල |
| 8000 - 11999 | 02 | හම්බන්තොට, මඩකලපුව |
| 12000 - 15999 | 02 | අම්පාර, කුරුණෑගල |
| 16000 - 19999 | 01 | පොළොන්නරුව |

* ඉහත දත්ත පදනම් කොට ගෙන සිතියම නිර්මාණය කරන අයුරු පැහැදිලි කර තිබිය යුතුය .

04. (i) ගුවන් ඡායාරූපයක් යනු, ගුවනේ සිට නිශ්චිත පියාසර සැලසුමකට අනුව නිශ්චිත පරිමාණයකින් යුක්තව භූමියෙහි කිසියම් තෝරාගත් කොටසක් ආවරණය වන ආකාරයට ලබා ගන්නා ඡායාරූපයකි.

(ii) ගුරු මාර්ගෝපදේශයේ 196 පිටුවෙහි ඇති රූප සටහන ඇසුරෙන් පැහැදිලි කිරීම අවශ්‍යයි.

(iii)
- කොරෝනා වසංගත අවස්ථාවේදී කොරෝනා වසංගත ප්‍රදේශ සොයා ගැනීමට.
- භූ ලක්ෂණ සිතියම් සකස් කිරීමේ දී මැනුම් කටයුතු සඳහා භාවිතා කිරීම.
-
-

05. (i) ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව ජන සංඛ්‍යාව

| පංති ප්‍රාන්තරය | ප්‍රගණනය | සංඛ්‍යානය | සමුච්චිත සංඛ්‍යාතිය | ප්‍රතිශත සමු.සංඛ්‍යාතිය |
|---|---|---|---|---|
| 92 - 538 | ~~iiii~~ iiii | 09 | 09 | 36 |
| 539 - 985 | ~~iiii~~ iiii | 09 | 18 | 72 |
| 986 - 1432 | iiii | 04 | 22 | 88 |
| 1433 - 1879 | i | 01 | 23 | 92 |
| 1880 - 2326 | ii | 02 | 25 | 100 |
| | | 25 | | |

මෙම වගුවෙහි 1,2,3 තීරු පමණක් සම්පූර්ණ නම් ලකුණු 3 දෙන්න.

(ii) $\text{Mdn} = l + \left(\frac{\frac{n}{2} - Fb}{Fw}\right)C$

$\text{Mdn} = 538.5 + \left(\frac{\frac{25}{2} - 9}{9}\right)447$

$= 538.5 + \left(\frac{\frac{2.5}{2} - 9}{9}\right)447$

$= 538.5 + \frac{3.5 \times 44.7}{9}$

$= 538.5 + 173.8$

$\text{Mdn} = \underline{\underline{712.3}}$

(iii)

* වගුව සම්පූර්ණ වී තිබිය යුතුය.

(iii) * දත්ත පරාසයක වියදම අගයක් දක්වා ඇති සංඛ්‍යානය ප්‍රස්තාරිකව ලබා ගැනීමට ඇති හැකියාව

* ජන සංඛ්‍යාව අගයන් සන්සන්දනය සඳහා යෝග්‍ය වේ.

* කිසියම් වටිනාකමකට ඉහළින් හෝ පහළින් පවත්නා ප්‍රතිශතය හඳුනා ගැනීමට හැකි වීම.

* විශාල දත්ත පද්ධතියක් වුවද පහසුවෙන් වටහා ගත හැකි වීම.

06. (i) ප්‍රස්තාරය සඳහා සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න

(ii) කැපී පෙනෙන ලක්ෂණ

* වැඩිම අපනයන භෝගය තේ වේ.

* අඩුම අපනයන භෝගය රබර් වේ.

* වෙනත් කෘෂි බෝග උපනයනය 2009 සිට සිසු වර්ධනයක් පෙන්වයි.

* 2011, 2013 වර්ෂවල පොල්, රබර් අපනයන පහත වැටී ඇත.

(iii) වෙනත් ක්‍රමයක් ලෙස බහු තීරු / සංකේත තීරු, සංයුක්ත තීරු

සටහන් (වසරින් වසරට)

මේ සඳහා කටු සටහන් ඇඳ පැහැදිලි කර ඇති නම් ලකුණු දෙන්න.

කටු සටහනට - 2

පැහැදිලි කිරීමට- 3

## පිළිතුරු 13 ශ්‍රේණිය II කොටස

01. I භෞතික භූගෝල විද්‍යාව

A - යුරේෂියානු තැටිය

B - ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය

C - පැසිපික් තැටිය

D - අප්‍රිකානු තැටිය

II * සාගරික බිම් නිර්මාණය වීම.

* නැමිකඳු නිර්මාණය වීම.

* සාගරික අගාධ නිර්මාණය වීම.

* ද්වීපත් චාප නිර්මාණය වීම.

* සුවිභේද නිම්න ඇතිවීම.

* භූමිකම්පා හට ගැනීම.

* ගිනිකඳු පිපිරීම.

* සුනාමි ඇතිවීම.

* නායයාම් ඇතිවීම.

* හිමකඳු කඩා වැටීම.

මේ අතරින් 3 ක් විස්තර විය යුතුය.

(ලකුණු 02 × 03 = 06)

III ආක්‍රාන්ත යමහල් භූ රූප

(i) සයික
(ii) ආස්තර
(iii) ලැකොලිත
(iv) ලොපොලිත
(v) පාකොලිත
(vi) බැකොලිත

මේ අතරින් 03 ක් විස්තර විය යුතුය.

(විස්තරය -01
රූප සටහන -01) (ල.06)

IV නිෂ්ක්‍රාන්ත යමහල් භූ රූප

(i) යමහල් කේතු
(ii) යමහල් අළු කේතු
(iii) සංයුක්ත කේතු
(iv) කල්දේරාව

(v) ලාවාසානු
(vi) ලාවා කේතු

මේ අතරින් 03 ක් විස්තර විය යුතුය.

(විස්තරය -01

රූප සටහන -01) (ල.06)

02. I පෘථිවියේ උස්කඳු ප්‍රදේශ වල නිර්මාණය වී ඇති ග්ලැසියර් නිම්න ග්ලැසියර් නමින් හැඳින්වේ. ධ්‍රැවාසන්න ප්‍රදේශ වල නිර්මාණය වී ඇති අයිස් යායවල් මහද්වීපික ග්ලැසියර් නමින් හඳුන්වයි.

(ලකුණු 02)

II බාදන ක්‍රියාවලිය ආකාර 3 කි.

(i) උත්පාටනය
(ii) උල්ලේඛය
(iii) පිරිසැරීම.

යන කරුණු වෙන් වෙන්ව විස්තර කර තිබේ නම් ලකුණු 02 × 03 = (06)

III (i) සර්ක
(ii) ගිරිවිල්
(iii) අරේට
(iv) පිරමීඩාකාර කඳු
(v) u හැඩ නිම්න
(vi) ලම්බ නිම්න
(vii) පීත්ත පටි විල්

මේ අතරින් 02 ක් රූප සටහන් සහිතව විස්තර විය යුතුය.

(i) ඩ්‍රම්ලින්
(ii) කේම
(iii) එස්කර්
(iv) අකුරු මැටි
(v) අගම් ගල්

මේ අතරින් 01 ක් රූප සටහන් සහිතව විස්තර විය යුතුය.

(vi) හෙබ

මේ අතරින් රූප සටහන් 3 සඳහා .

(විස්තරය -01

රූප සටහන -01) (ල.06)

IV ධීවර කර්මාන්තයට බලපාන ආකාරය

සංචාරක කර්මාන්තයට බලපාන ආකාරය

හිම ක්‍රීඩා ආදි

කරුණු 03 ක් විස්තර විය යුතුය.

(ල.06)

03. I (i) උෂ්ණත්වය

(ii) වර්ෂාපතනය

(iii) ආර්ද්‍රතාවය

(iv) පීඩනය හා සුළං

(v) දෘශ්‍යතාව

(vi) වළාකුළු

II (i) සූර්ය විකිරණ තීව්‍රතාව

(ii) අක්ෂාංශ අනුව සූර්ය විකිරණයේ ඇති වන වෙනස

(iii) සාගර හා ගොඩබිම් ව්‍යාප්තිය

(iv) සාගර ප්‍රවාහ

(v) කඳු බාධක

(vi) අඩු පීඩන හා වැඩි පීඩන පද්ධති වල පිහිටීම

(vii) ගෝලීය පීඩන තීර

(viii) ග්‍රහීය සුළං සංසරණය

මේ අතරින් 3 ක් විස්තර විය යුතුය.

(ලකුණු 02 × 03 = 06)

III (i) ඉන්දියාවේ නිරිතදිග හා බටහිර වෙරළබඩ ප්‍රදේශ

(ii) ශ්‍රී ලංකාවේ තෙත් කලාපය

(iii) නිව්ගිනියාවේ බටහිර තුඩුව

(iv) ඉන්දුනීසියාවේ බෝර්නියෝ දූපත

(v) අප්‍රිකාවේ සියරාලියෝන්

(vi) ලයිබීරියාව (ලකුණු 01 × 02 = 02)

IV (i) වාසුලියක ප්‍රබලතාව අනුව හානිදායක වැසි ලැබීම.

(ii) ගංවතුර ඇති වීම.

(iii) නායයාම් ඇති වීම.

(iv) දේපළ හා ජීවිත හානි ඇති වීම.

(v) යටිතල පහසුකම් වලට හානි සිදුවීම.

(vi) ධීවර කර්මාන්තය කෙරෙහි අයහපත් බලපෑම් ඇති වීම.

(vii) වර්ෂාපතනය අඩු වියළි කලාපීය ප්‍රදේශවලට වැසි ලැබීම.

04. I බියෝමයක් යනුවෙන් අදහස් කරන්නේ ''යම්'' දේශගුණ වර්ගයකට අනුවර්තනය වූ නිශ්චිත ශාක හා ෂත්ත්ව ප්‍රජාවක් සහිත පරිසරයකි.

II ශාක වල වෙනස්කම්

(i) සිහින් පත්‍ර දැරීම.

(ii) පත්‍ර පතනය

(iii) පත්‍ර ඉටි වැස්ම සහිත වීම.

(iv) දිගු මුල් පද්ධතිය

(v) කටු සහ යුෂ සහිත බව

(vi) මාංසල කඳන් දැරීම.

(vii) ශාක වැස්ම පැතිරීම.

සත්ත්ව ප්‍රජාවේ වෙනස්කම්

(i) සත්තු ශුෂ්කතාවට අනුවර්තනය වී ඇත. (ජලය ගබඩා කර ගැනීමට මොල්ලියක් තිබීම නිදසුනකි)

(ii) සත්තු ගුල් පාරාගෙන ජීවත් වීම.

(iii) බොහෝ සතුන් නිශාචර වීම.

(iv) භූතල උෂ්ණත්වයෙන් ආරක්ෂා වී සඳහා සමහර පක්ෂීහු 300ප තරම් උසින් පියාසර කිරීම.

(iv) කාන්තාර පරිසරයට හැඩගැසුණු සත්වයෝ වාසය කරති. (ඔටුවා, කාන්තාර කටුස්සා, කුහුඹුවන්, කාන්තාර මීයා, උරගයෝ)

III (i) තෙත් පතන තණබිම්

වියළි පතන තණ බිම්

දමන (තලාව) තණ බිම්

විල්ලු

මේ අතරින් තුනක ව්‍යාප්තිය 01 × 03

දේශගුණික ලක්ෂණ 01 × 03

(ල.06)

IV (i) වන හරණය

(ii) ඉඩම් සඳහා ඇති ඉල්ලුම වැඩිවීම.

(iii) වනාන්තර ආශ්‍රිත ගම් හා නගර පුළුල් කිරීම.

(iv) ජාන මංකොල්ලය, ජාන අපනයනය නිසා තෙත් කලාපීය පැළෑටි හා වන ජීවීන්ට තර්ජන එල්ල වීම.

(v) අනවසර දැව කැපීම.

(vi) ඉන්ධන සඳහා දර භාවිතය.

(vii) කඳුකර පරිසර පද්ධතිය තුළ අනවසර මැණික් ගැරීම.

(viii) ජනාවාස පිහිටුවා රූනීම හා ජලාශ ඉදි කිරීම.

(ix) තෙත් බිම් ගොඩ කිරීම හා විවිධ ඉදිකිරීම් සිදු කිරීම.

(x) මානව ක්‍රියාකාරකම් නිසා කඩොලාන විනාශ වීම.

මේ අතරින් 3 ක් පැහැදිලි කළ යුතුය.

(ලකුණු 02 × 03 = 06)

## මානුෂ භූගෝල විද්‍යාව

05. I
- සෑම වසරකම ශුද්ධ සංක්‍රමණ අගය සෘණ අගයක් ගෙන තිබීම.
- ශුද්ධ සංක්‍රමණ සෘණ අගය සා..... වශයෙන් වැඩිවී තිබීම.
- 2009-2010 වර්ෂවල ශුද්ධ සංක්‍රමණ සෘණ අගය පෙර වර්ෂයට සාපේක්ෂව අඩු වී තිබීම (1.1)

මෙවැනි පිළිතුරු 2ක්

II
- 12 භූගෝල විද්‍යා ගුරු මාර්ගෝපදේශය 125 පිටුව

එවැනි බලපෑම් 3 ක් කෙටියෙන් විස්තර කිරීමට (ලකුණු 03 × 02 = 06)

III
- ආගමන වලට වඩා විගමන ප්‍රමාණය වැඩිය.
- එම නිසා ශුද්ධ සංක්‍රමණ අනුපාතිකය සෘණ අගයක් ගැනීම ඉහළයි. /වැඩියි.
- ගමනාන්ත දිශානතිය වෙනස් වීම.

උදා:- නැගෙනහිර ආසියාතික රටවල්

බටහිර රටවල් කරා යොමු වීම.

- උසස් අධ්‍යාපනය සඳහා යොමු වීම වැඩිය.
- නුපුහුණු ශ්‍රමිකයින්ගේ විදෙස්ගත වීම වැඩිය.

- ඍජු ගමනාන්තය / විගමනය ට වඩා වක්‍ර ගමනාන්ත /විගමනයට යොමු වීම.

උදා:- රුමේනියාව ⟶ ඉතාලිය

මෙවැනි පිළිතුරු තුනකට ල. 03 × 02 = 06)

IV ගමනාන්ත රටවලට ඇති වන ධනාත්මක ප්‍රතිඵල හා ඍණාත්මක ප්‍රතිඵල

12 ගු.මා.සං. 110 පිටුව

(ල.02× 03 = 06)

06. I (i) නාගරික ජන සංඛ්‍යාවේ ස්වාභාවික වර්ධනය

(ii) ග්‍රාමීය නාගරික සංක්‍රමණ

(iii) පරිපාලන සීමා වෙනස් වීම. (ල.01× 02 = 02)

II (i) රටක් සංවර්ධනයේ කේන්ද්‍රස්ථාන ලෙස කටයුතු කිරීම.

(ii) සෞඛ්‍ය හා සුභ සාධන කටයුතු ව්‍යාප්ත වීම.

(iii) අධ්‍යාපන පහසුකම් ව්‍යාප්ත වීම.

(iv) සන්නිවේදන පහසුකම් ව්‍යාප්ත වීම.

(v) ප්‍රවාහන පහසුකම් ව්‍යාප්ත වීම.

(vi) දේශපාලනික කටයුතු ව්‍යාප්ත වීම.

(vii) ආර්ථිකමය හා වාණිජ කටයුතු ව්‍යාප්ත වීම.

(viii) තාක්ෂණික දැනුම හා තාක්ෂණය ව්‍යාප්ත වීම.

(ix) සංස්කෘතිකමය වටිනාකම් ව්‍යාප්ත වීම.

(x) විද්‍යාත්මක දැනුම හා සොයා ගැනීම.

(xi) ආකල්පමය වෙනස්කම් ව්‍යාප්ත වීම.

වැනි සාදක අතරින් 2 ක් නාගරික ප්‍රදේශ තුළින් ආරම්භ වී අනෙකුත් ප්‍රදේශ කරා ව්‍යාප්ත වන ආකාරය පිළිබඳ පැහැදිලි කළ යුතුය.

(ල.02× 03 = 06)

III (i) පරිසර දූෂණය හා ඝන අපද්‍රව්‍ය පිළිබඳ ගැටලු

(ii) මහා මාර්ග අබලන් වීම හා ප්‍රවාහන ගැටලු

(iii) ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති වීම.

(iv) පොදු සේවා පහසුකම් පිළිබඳ ගැටලු

(v) මහා මාර්ග, කානු පද්ධති ආදිය නිසා පරිදි නඩත්තුව නොමැතිකම

(vi) සමාජීය ගැටලු (සිඟාකෑම, ගණිකා වෘත්තිය, මත්ද්‍රව්‍ය ආදී.....)

මේ අතරින් සාදක 02 ක් විස්තර විය යුතුය.

(ලකුණු 02 × 03 = 06)

IV 12 ශ්‍රේණිය ගු.මා.සං.155 හා 156 පිටු වල ඇති කරුණු වලින් තුනක් විස්තර විය යුතුය.

(ලකුණු 02× 03 = 06)

07. I අමු ද්‍රව්‍යයක් නිමි ද්‍රව්‍යයක් බවට හෝ අර්ධ නිමි ද්‍රව්‍යයක් බවට පත් කිරීමේ ක්‍රියාවලියයි.

(ලකුණු 02)

II 12 ශ්‍රේණිය ගු.මා.සං. 94 හා 95 පිටු එම සාධක දෙක විස්තර කළ යුතුය.

(ලකුණු 03 × 02 = 06)

III 12 ශ්‍රේණිය ගු.මා.සං. 97 පිටුව

මේ අතරින් කරුණු 03 ක් විස්තර විය යුතුය.

(ලකුණු 02 × 03 = 06)

IV (i) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උපයන ප්‍රධාන කර්මාන්තයක් වීම.

(ii) රැකියා උත්පාදනය ඉහළ මට්ටමක පැවතීම.

(iii) ප්‍රාදේශීය සංවර්ධනයට දායක වීම.

(iv) අර්ථික වර්ධනයට යහපත් බලපෑම් ඇති කිරීම.

08. I (i) ආර්ථික ගෝලීයකරණය

(ii) සංස්කෘතික ගෝලීයකරණය

(iii) දේශපාලන ගෝලීයකරණය

(iv) තාක්ෂණික ගෝලීයකරණය

(ලකුණු 02)

II (i) වෙළඳාම

(ii) විදේශ ඍජු ආයෝජනය

(iii) මුදල් ගලනය

(iv) සංක්‍රමණය

(v) තාක්ෂණය ව්‍යාප්තිය

මේ අතරින් කරුණු 03 ක් විස්තර කළ යුතුය.

(ලකුණු 02 × 03 = 06)

III ගු.මා.සං. 13 ශ්‍රේණිය 116 පිටුව

(ලකුණු 06)

II (i) කලාපීය රටවල ජනතාවගේ දිළිඳුකම තව දුරටත් උග්‍ර ගැටලුවක් ලෙස පැවතීම.

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(ii) ත්‍රස්තවාදී ඉලක්ක බවට සාමාජික රටවල් පත්වීම. උදා:- වැලි බෝම්බ ප්‍රහාරය

(iii) මත්ද්‍රව්‍ය වෙළඳාම

(iv) අනවසර ආයුධ වෙළඳාම

මේ අතරින් කරුණු 03 ක් විස්තර කළ යුතුය.

(ලකුණු 02 × 03 = 06)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සුහද

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න